සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 06 - 2023

## ඉතිහාසය

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

### I කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

01. ක්‍රිස්තු වර්ෂ දොළොස්වන සියවසේදී ........................................................ විසින් පොළොන්නරුවේ ගල් විහාරයේ ඉදි කරවන ලදී.
(දුටුගැමුණු රජතුමා/ පළමු විජයබාහු රජතුමා/ මහා පරාක්‍රමබාහු රජතුමා)

02. බුදුන් වහන්සේගේ ........................................................ පදනම් කරගනිමින් බුද්ධ වර්ෂ ක්‍රමය ආරම්භ වී ඇත.
(උපත/ බුද්ධත්වය/ පරිනිර්වාණය)

03. මීට වසර දසලක්ෂ පන්සිය හතළිස් දෙකකට පෙර ජීවත් වූ ''ඔපබීනියාවෙකුගේ'' පාෂාණීභූත සලකුණක් ................. ....................................... සොයාගෙන ඇත.
(ඉරාකයෙන්/ ඊශ්‍රායලයෙන්/ කැනඩාවෙන්)

04. ලෝකයේ මුලින් ම තිරිඟු වගා කර ඇත්තේ ........................................................ වැසියන් විසිනි.
(මධ්‍යධරණී ප්‍රදේශයේ/ මධ්‍යම මෙක්සිකෝවේ/ චීනයේ)

05. පැරණි මෙසොපොතේමියා ශිෂ්ටාචාරයට අයත් ප්‍රදේශ වර්තමානයේ දී ........................................................ අයත් වේ.
(ඉරානයට/ ඉරාකයට/ ඉන්දියාවට)

- **අංක 6-10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✕) ලකුණ ද, ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06. මහානාම හිමියන් විසින් දීප වංශය රචනා කර ඇත. (   )

07. චිම්පන්සියකුගෙන් මානවයකු බිහිවීමේ ක්‍රියාවලිය මානව පරිණාමය ලෙස හැඳින්වේ. (   )

08. පළමුවරට රබර් බෝලය සාදනු ලැබුවේ ඉන්දු නිම්න වැසියන් විසිනි. (   )

09. හෝමෝ නියැන්ඩතාලන්සිස් මානවයා විශාල සතුන්ගේ ඇටකටු භාවිතකර නිවාස සාදා ගන්නා ලදී. (   )

10. උපතිස්ස ග්‍රාමය මල්වතු ඔය ආසන්නයේ පිහිටි පැරණි ජනාවාසයකි. (   )



LIVEWORKSHEETS

● අංක 11-15 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11. මිනිසකු වීමට නැඹුරුවක් ඇති කළ **පැරණිතම** වානරයා වන්නේ,
   i. හෝමෝ සාපියන් ය.   ii. හෝමෝ හැබිලිස් ය.   iii. ඔස්ට්‍රලෝපිතිකස් ය.   iv. හෝමෝ ඉරෙක්ටස් ය.

12. මුලින් ම දුනු ඊතල භාවිත කරමින් දඩයම් කිරීම් ආරම්භ වූ යුගය කුමක් ද?
   i. හොලෝසීන යුගය   ii. පූර්ව ශිලා යුගය   iii. මධ්‍ය ශිලා යුගය   iv. නව ශිලා යුගය

13. පණ්ඩුකාභය රජුගේ පියා කවුරුන් ද?
   i. පණ්ඩුවාසදේව   ii. දීඝගාමිණී   iii. විජය   iv. පණ්ඩුල

14. ''කම්මාරදේව'' යන දෙවියන් අදහන ලද්දේ,
   i. කම්මල් වැඩ කළ අය විසිනි   ii. වැදි ජනයා විසිනි
   iii. බ්‍රාහ්මණයන් විසිනි   iv. වළං සාදන්නන් විසිනි

15. පහත සඳහන් වැව් අතරින් පණ්ඩුකාභය රජතුමා විසින් කරවන ලද වැව කුමක් ද?
   i. තිසා වැව   ii. කලා වැව   iii. නුවර වැව   iv. අභය වැව

● අංක 16-20 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර ලියන්න.

16. මිනිසා තම මළගිය ඥාතීන් වෙනුවෙන් අවමංගල චාරිත්‍ර පැවැත්වීම ආරම්භ කරන ලද්දේ ............................................ ශිලා යුගයේ දී ය.

17. දේවානම්පියතිස්ස රජතුමා විසින් භික්ෂූන් වහන්සේලා සඳහා ඉදිකරන ලද දාන ශාලාව ................................................ නමින් හැඳින්වේ.

18. ථූපාරාම දාගැබට වටදාගෙයක් ඉදිකරවන ලද්දේ ........................................................ රජතුමා විසිනි.

19. විජය කුමරු ........................................................ නම් ස්ථානයෙන් ලංකාවට ගොඩබසින ලදි.

20. පණ්ඩුකාභය රජුතුමා ........................................................ අගනගරය කරගනිමින් ලංකාව පාලනය කරන ලදි.

(ලකුණු 2×20=40යි)



LIVEWORKSHEETS